සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk
PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary — Office – 045 2223015
කාර්යාලය / Office — නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number: ME/E/11/08/2-2වෙළම
ඔබේ අංකය / உமது இல / Your Number:
දිනය / திகதி / Date: 2024/07/15

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අධ්‍යක්ෂ මෙනේරිපිටිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය,
අධ්‍යක්ෂ අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය,
සියළුම විදුහල්පතිවරුන් වෙත.

**සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන සියලුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම -2024(2025)**

සබරගමුව පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ වන සියළුම කලාප අධ්‍යාපන කාර්යාල/පාසල්/ පුහුණු මධ්‍යස්ථාන වල සේවය කරනු ලබන (කා.සේ.සේවය නොවන) සේවකයින්ගේ වාර්ෂික ස්ථාන මාරු 2025.01.01දින සිට ක්‍රියාත්මක කිරීමට අදාළව අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වර්තමාන සේවා ස්ථානයේ වසර 05 කට වැඩි සේවා සේවා කාලයක් ඇති සේවකයින් ස්ථාන මාරු කිරීමට යටත්වන බැවින් වර්තමාන සේවා ස්ථානයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සහිත සේවකයින් අනිවාර්යයෙන්ම ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කල යුතුවේ.එසේ ඉදිරිපත් නොකළහොත් ඕනෑම සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීමට කැමැත්ත ඇති සේ සලකා ක්‍රියා කරනු ඇත. මේ යටතේ වසර 02 හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත සේවකයින් ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

<u>උපදෙස්-:</u>

i. වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අනධ්‍යයන සේවකයින් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පළමු පරිශිෂ්ටයේ ඇති ආකෘතිය ප්‍රකාරව විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.
ii. එක් අනධ්‍යයන සේවකයෙකු එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය.
iii. වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම, ස්ථාන මාරුවලට යටත් වන අනධ්‍යයන සේවකයන්ගේ වගකීම වන අතර එසේ අයදුම් නොකරන නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති අනධ්‍යයන සේවකයන් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇතිවන ආයතනයක් වෙත ස්ථාන මාරු කරනු ලැබේ.
iv. විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.
v. මාරු වීම් අපේක්ෂා නොකරන්නේ වුවද වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය අනුව ඊට යටත්වන සියලු සේවකයන්ගේ තොරතුරු 03 පරිශිෂ්ටය අනුව ද, ස්ථාන මාරු අයදුම්කර ඇති සියළු සේවකයින්ගේ තොරතුරු 04 පරිශිෂ්ඨය අනුව ද සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත 2024.08.28 දිනට පෙර අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.
vi. තවද එක් එක් තනතුරට අදාළව වෙන් වෙන් වශයෙන් අයදුම්පත් පරිශිෂ්ඨයේ ලේඛනගත කර ඉදිරිපත් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

**<u>ස්ථාන මාරු අයදුම්පත් යොමුකළ යුතු අනිවාර්ය කාල සීමාවන්</u>**

i. අනධ්‍යයන සේවකයින්ගේ අයදුම්පත් අදාළ විදුහල්පති වරුන් **2024.08.15 (2024.07.15-2024.08.14** දින දක්වා ) දිනට ප්‍රථම යොමු කළ යුතුය.(මෙම කාල සීමාව ඇතුළත පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. විදුහල්පතිවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත **2024.08.14 (2024.08.14** දින සිට **2024.08.28** දින දක්වා) දිනට ප්‍රථම යොමු කල යුතුය.

iii. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිත එකී අයදුම්පත් **2024.08.28** දිනට පළාත් අධ්‍යාපන ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය

**<u>වෙනත් විශේෂ කරුණු</u>**

i. වාර්ෂික ස්ථාන මාරු 2023(2024)යටතේ අන්තර් කලාප ස්ථාන මාරු අයදුම් කර ස්ථාන මාරු නොලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ තොරතුරු ද අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් මේ සමඟ ඉදිරිපත් කළ යුතුය.

<u>සැලකිය යුතුයි.</u>

i. වාර්ෂික ස්ථාන මාරු 2023(2024) යටතේ 2024.08.14 දින සිට ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන දිනය තෙක් වාර්ෂික ස්ථාන මාරු නොවන අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදු නොකිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වගබලා ගතයුතුය.

03. වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය යටතේ සේවා අවශ්‍යතාවය හා සේවකයින්ගේ ඉල්ලීම මත කෙරෙන ස්ථාන මාරු නියෝග අනුව සේවකයින් නොපමාව නිදහස් කිරීමටත් ලබා දෙන අනුප්‍රාප්තිකයා සේවයේ යෙදවීමටත් කටයුතු කරන මෙන් දන්වන අතර මෙම ලිපියේ සඳහන් නියමයන් අදාළ පාර්ශ්වයන් වෙත දන්වා වාර්ෂික ස්ථාන මාරු ඵලදායිව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

04. මේ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් 0452222542 දුරකථන අංකයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්/පරිපාලන නිලධාරී විමසිය හැක.

බී.ඒ.සී.පී.බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර

පිටපත්

01.ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව -කාරුණික දැ.ගැ.ස
02.ආණ්ඩුකාර ලේකම්,සබරගමුව පළාත් සභාව -ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කිරීම සඳහා
03.සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් -ඔබ කොට්ඨාසයේ විදුහල්පති වරුන් මගින් සියළුම අනධ්‍යයන සේවකයින් දැනුවත් කිරීම සඳහා